චක්‍රලේඛ අංක :- 06/2007

මගේ අංකය:-මප/සසේකො/ලේ.නිර්/2007

සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.),
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ - 08.
2007.01.26

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිති සහ සංගම්
සභාපතිවරුන් වෙත,

**සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු දීම සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා නිරීක්ෂණ නිලධාරියකු යෙදවීම**

මෙම කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 7/99 චක්‍රලේඛය මගින් සම්මුඛ පරීක්ෂණවල දී අපේක්ෂකයින්ට ලකුණු දීම පිළිබඳ උපදෙස් ලබා දී ඇති අතර, මෙමගින් එකී ලකුණු දීමේ ක්‍රමයේ සංශෝධන සිදු කරනු ලැබේ.

(අ) අධ්‍යාපන සුදුසුකම් - 25%
(මූලික අධ්‍යාපන සුදුසුකම් 12.5, ඊට ඉහල විභාග සමත් වීම 12.5)

(ආ) සේවා කාලය සඳහා - 25%
(අවසන්තරම් වැටුප් පරිමාණයේ වසරකට 05, ඊළඟට පහල වැටුප් පරිමාණයේ වසරකට 02)

(ඇ) සමුපකාර විෂය පිළිබඳ සමත් විභාග - 25%
I. සමුපකාර සාමාන්‍ය පෙළ - 05
II. සමුපකාර උසස් පෙළ - 07
III. තනතුරට අදාළ වූ ඩිප්ලෝමා සහතිකය - 10
IV. විවිධ පුහුණු පාඨමාලා සඳහා උපරිම - 03
(මසක් හෝ ඊට වැඩි පාඨමාලාවකට ලකුණු 01 බැගින් උපරිම 03)

(ඈ) වෙනත් කරුණු සඳහා - 25%
(මෙය පහත දැක්වෙන පරිදි විභජනය විය යුතුයි)
I. දරා ඇති විශේෂ වගකීම් - 05
II. විශේෂ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් - 05
III. කාර්යක්ෂමතාවය - 10
IV. නායකත්වය, ක්‍රීඩා සහ පෞරුෂත්වය - 05

මේ අයුරින් ලකුණු ලබා දීමෙන් තොරව ඉදිරිපත් කරන සම්මුඛ පරීක්ෂණ වාර්තා කොමිෂන් සභාව විසින් භාර නොගන්නා බව ද කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

සෑම සම්මුඛ පරීක්ෂණයක් සඳහාම කොමිෂන් සභාවේ නිරීක්ෂණ නිලධාරියකු යෙදවීමට තීරණය කර ඇති අතර, සම්මුඛ පරීක්ෂණයකට සති දෙකකටවත් කලින් සම්මුඛ පරීක්ෂණ වලට අදාළ විස්තර සහ දින කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතුය.